සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education – NWP**

දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017

Second Term Test - Grade 7 - 2017

නම : ............................................ සිංහල භාෂාව හා සාහිත්‍යය කාලය : පැය 2යි.

# I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට අර්ථයෙන් සමාන පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(1) අභිප්‍රාය - (කැමැත්ත, අකමැත්ත, සතුට)

(2) ප්‍රචලිත - (සෙලවෙන, ප්‍රසිද්ධ, පැරණි)

(3) උරණව - (සතුටින්, සමගියෙන්, කෝප වී)

- අංක 4 හා 5 ප්‍රශ්නවල දැක්වෙන වගන්තිවල හිස්තැන් පුරවන්න.

(4) විද්දේ හාවාට වැදුනේ .................................................. .

(5) .................................................. පානා අඬහැරෙන් දුනේ.

- අංක 6 සහ 7 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(6) (i) ඖෂධ (ii) ලාංජනය (iii) මලුව

(7) (i) අනර්ග (ii) දෘෂ්ඨි (iii) ශිෂ්ටාචාරය

(8) "ඉරුගේ පොඩි පැටවුන් මෙන්
බබළන රන්වන් මල් ඇති"
මෙහි සඳහන් උපමාව වෙන් කර ලියන්න.
..............................................................................

- අංක 9 සහ 10 ප්‍රශ්නවල දී ඇති වගන්ති සඳහා තනි පදය බැගින් ලියන්න.

(9) විහාර, දේවාල ආදිය නඩත්තුව සඳහා පූජා කරන ඉඩම් - ..........................................

(10) පළමුවරට සිරිපා කරුණා කරන්නා - ..................................

- අංක 11 සහ 12 ප්‍රශ්නවල දී ඇති වාක්‍ය සම්පූර්ණ වීමට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(11) අම්මා පුතුට කිරි ......................................... (පෙව්වේය, පෙවූහ, පෙව්වාය) .

(12) ......................................... ආයුධ තනති. (කම්මල්කරුවෝ, කම්මල්කරුවන්, කම්මල්කරුවෙක්)



EXAMRESULTS.LK

(13) දී ඇති වැකියට නිවැරදිව විරාම ලක්ෂණ යොදන්න.

හරි හරි දූන් මට පූළුවන්

v අංක 14 සහ 15 ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(14) සුගතිය - ප්‍රගතිය, විරතිය, දුගතිය

(15) සසල - නිසල, චංචල, චාචාල

(16) දී ඇති වැකිය නිවැරදිව පද බෙදා නැවත ලියන්න.
විවිධලෝහභාවිතයෙන්අතීතලාංකිකයාකලානිර්මාණකරඇත.

..........................................................................................................................................................................

(17) යුගල පදයක් නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න.
(i) හරබර (ii) සරුසාර (iii) කරදර

(18) දී ඇති කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ජම්බු ගහට රත පොරටන්නී
බක්මී ගහ කහ අන්දන්නී

.............................................................

.............................................................

(19) දී ඇති පදවල අනුක්ත පද ලියන්න.

(i) ගැහැනියක්:- .................................... (ii) මිනිස්සු:- ..................................

(20) I. මහාප්‍රාණ අක්ෂරයක් සහිත වචනයක් ලියන්න. ...............................................

II. සඤ්ඤක අක්ෂරයක් සහිත වචනයක් ලියන්න. ...............................................

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

v 1,2, හා 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) නූතන සිංහල අක්ෂර මාලාවේ

(අ) ස්වර කීයද?

(ආ) ව්‍යඤ්ජන කීයද?

(ii) රාජකාරි ලිපියක ආකෘතික ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

(iii) මහ බෝ වන්නම, සරස්වතී අභිනන්දනය වැනි ගීතවල පද රචනා කළේ කවුද?

(iv) (අ) උත්තම පුරුෂ ඒකවචන අතීත කාල ක්‍රියා පදයක් ලියන්න.

(ආ) මධ්‍යම පුරුෂ බහුවචන නාමපදයක් ලියන්න.

(v) පහත සඳහන් කමත් භාෂාවේ යෙදුම් සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පදය බැගින් ලියන්න.

(අ) මැඩුවත්

(ආ) යතුර (ලකුණු 2 x 5 = 10 )

(2) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරාගෙන රචනයක් ලියන්න.

(අ) සඳ පහන් රැය (ඉ) මම ගංවතුරකට මැදි වීමි.

(ආ) දෙමවුපියන්ගේ අගය (ඊ) ගැමි දිවියේ මිහිර (ලකුණු 20)

(3) ඔබ පාසලේ පැවැත්වෙන පරිසර නියමු නිල ලාංඡන පැළඳවීමේ උත්සවයට සහභාගී වන ලෙස දන්වමින් දෙමව්පියන්ට යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. (ලකුණු 10 )

(4) පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දවල් තිස්සෙ
පඳුරු අස්සෙ
හැංගෙන පොඩි
හාවා
පාට දුඹුරු
ඇස් වටකුරු
ලෝම තිබෙන
හාවා
කට දෙපැත්තෙ
කෙඳි බුරුත්ත
දිගට ඇදුණු
හාවා

(i) ඉහත කවියෙන් කියැවෙන සතා කවුද?

(ii) එම සතාගේ ශරීර ලක්ෂණ දෙකක් ලියන්න.

(iii) දී ඇති පදවලට විරුද්ධ පද කවියෙන් තෝරා ලියන්න.

(අ) රාත්‍රී

(ආ) කෙටියට

(iv) කවියේ සඳහන් නාම විශේෂණ පද දෙකක් ලියන්න.

(v) මෙම කවියේ රචකයා කවුද? (ලකුණු 2 x 5 = 10)

(5) පහත වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.

(i) මා ගමට ගියෙමි.

(ii) නංගී මල් කැඩුවේ ය.

(iii) මල්ලීත් නංගීත් සෙල්ලම් කරයි.

(iv) ඔබ පාසලට ගියෙහු.

(v) මිනිසුන් පාරේ වැඩ කරති. (ලකුණු 2 x 5 = 10)

(6) දී ඇති උධෘතය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

''කුඩා කොල්ලා හෙයින් බඩ සයින් කාපුව මැනව''

(i) මෙසේ සිතන්නේ කවුද?
(ii) කුඩා කොල්ලා කෑවේ මොනවා ද?
(iii) 'බඩ සයින්' යන්නෙහි අර්ථය ලියන්න.
(iv) මෙය උපුටා ගත් පාඩම කුමක් ද?
(v) පාඩම උපුටාගත් මුල් කෘතිය කුමක් ද? (ලකුණු 2 x 5 = 10 )

(7) දී ඇති උද්ධෘතය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

''මැණිකේ, හීල් අඩුක්කුවට 'කිරි කබළු' ටිකක් සූදානම් කරන්න.''

(i) මේ ප්‍රකාශය කළේ කවුද?
(ii) පහත වචනවල පොදු ව්‍යවහාරය ලියන්න.
    (අ) හීල් අඩුක්කුව
    (ආ) කිරි කබළු
(iii) මේ කොටස උපුටාගත් පාඩම කුමක් ද?
(iv) ඉහත ප්‍රකාශයට මැණිකේ දුන් පිළිතුර කුමක් ද?
(v) කමත් බසින් 'රතු ගඟුල' යනු තේ වතුර නම් 'කළු ගඟුල' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
(ලකුණු 2 x 5 = 10 )

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education – NWP**

## දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017

## Second Term Test - Grade 7 - 2017

### සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු පත්‍රය

## I කොටස

(1) කැමැත්ත
(2) ප්‍රසිද්ධ
(3) කෝප වී
(4) පඬුරට
(5) හානා හීය
(6) ලාංඡනය
(7) ශිෂ්ටාචාරය
(8) ඉරුගේ පොඩි පැටවුන් මෙන්
(9) ගම්වර
(10) කෝඩුකාරයා
(11) පෙව්වා ය.
(12) කම්මල්කරුවෝ
(13) "හරි හරි දූන් මට පුළුවන්"
(14) දුගතිය
(15) නිසල
(16) විවිධ ලෝහ භාවිතයෙන් අතීත ලාංකිකයා කලා නිර්මාණ කර ඇත.
(17) කරදර
(18) අඹ දලු ළා රත   තවරන්නී
ලෝ කත විසිතුරු   කරලන්නී
(19) (i) ගැහැණියක   (ii) මිනිසුන්
(20) (i) ඹ, ඡ, ධ, ඊ, ඵ, ඍ, ඣ, ඪ, ඨ, භ   (ii) ඟ, ඦ, ඬ, ඳ, ඹ   (ලකුණු 2 x 20 = 40)

## II කොටස

(1) (i) (අ) 18
(ආ) 42

(ii)
- යවන්නාගේ ලිපිනය
- දිනය
- ලබන්නාගේ ලිපිනය
- ආමන්ත්‍රණය
- මාතෘකාව
- අන්තර්ගතය
- ස්තුතිය
- අත්සන

(iii) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා
(iv) (අ) ගියෙමි, කැවෙමි, දිව්වෙමි...
(ආ) නුඹලා, තොපි, ඔබලා
(v) (අ) පිදුරු (ආ) කුල්ල
(ලකුණු 2 x 5 = 10)

(2) ලකුණු විග්‍රහය
1. සාරවත්භාවය (ලකුණු 6)
2. සංවිධානය, නිර්මාණාත්මක බව, ස්වීයත්වය (ලකුණු 10)
3. ශිල්පීය දක්ෂතා (ලකුණු 4)

(3) ආකෘතිය (ලකුණු 3)
අන්තර්ගතය (ලකුණු 5)
ශිල්පීය දක්ෂතා (ලකුණු 2)

(4) (i) හාවා
(ii) දුඹුරු පාට, වටකුරු ඇස්, ලෝම සහිත වීම.
(iii) (අ) දවල් (ආ) දිගට
(iv) පොඩි, දුඹුරු, වටකුරු
(v) එස්.මහින්ද හිමි. (ලකුණු 2 x 5 = 10)

(5) (i) මම ගමට ගියෙමි.
(ii) නංගී මල් කැඩුවා ය.
(iii) මල්ලීත් නංගීත් සෙල්ලම් කරති.
(iv) ඔබ පාසලට ගියෙහි.
(v) මිනිස්සු පාරේ වැඩ කරති.
(ලකුණු 2 x 5 = 10)

(6) (i) මහළු ස්ත්‍රිය
(ii) තල
(iii) බඩගින්නක්/ කුසගින්න
(iv) තිලමුට්ඨි ජාතකය
(v) පන්සිය පනස් ජාතක පොත
(ලකුණු 2 x 5 = 10)

(7) (i) රාලහාමි/ අප්පච්චි
(ii) (අ) උදේ ආහාරය
(ආ) ආප්ප
(iii) ඔයිරයිරේ ඔයිරාමා
(iv) "හොඳයි රාලහාමි"
(v) කෝපි (ලකුණු 2 x 5 = 10)